**ශීර්ෂය 331 - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

**---------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුනි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-----------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මෙම වාර්තාවේ 1.6.3 (ඇ) ඡේදය සම්බන්ධයෙන් මා විසින් කර තිබුණු නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 අක් මුදල් ගැලපුම් ගිණුම

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව අග්‍රිම ගිණුමේ ශේෂය රු.3,986,130,203 ක් වී තිබුණු අතර, දෙපාර්තමේන්තුවේ පොත් අනුව එම ශේෂය රු.380,538 ක් වී තිබුණි. ඒ අනුව වෙනස රු.3,985,749,665 ක් වි තිබුණි. එම වෙනස සැසදිම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 6 හා 7(vi) ඡේදය ප්‍රකාරව අග්‍රිම සැසදුම් ප්‍රකාශයක් පිළියෙළ කර තිබුණි. සකස් කර තිබූ සැසදුම් ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (අ) මුදල් රෙගුලාසි 208 ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් වැය කර තිබූ රු.5,000,281,664 ක මුදල වෙනුවට රු.5,001,862,782 ක් අග්‍රිම ගැලපුම් ගිණුමට හර කර තිබීම හේතුවෙන් රු.1,581,113 ක් වැඩියෙන් හර කර තිබුණි. | ඉදිරිපත් කරන ලද නිරීක්ෂණයට පිළිතුර අදාළ නොවේ. | සියළු ගැලපීම් නිවැරදිව හදුනාගෙන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ ප්‍රකාරව අග්‍රිම ගැලපුම් ගිණුම පිළියෙල කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) දෙපාර්තමේන්තුව විසින් වෙනත් ආදායම් සංකේත වෙනුවෙන් රැස් කර තිබූ රු.741,844,910 ක ආදායම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අංක 6 හි 7(ii) ඡේදය ප්‍රකාරව අක්මුදල් ගැලැපුම් ගිණුමේ සටහන් නොකළ යුතු වුවත්, එම වටිනාකම අක් මුදල් ගැලැපුම් ගිණුමේ හර හා බැර වශයෙන් දක්වා තිබුණි. | වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් කරන ලද එකතු කිරීමක් බැවින් අග්‍රිම ගිණුමේ හර හා බැර වශයෙන් දක්වා ඇත. එම සටහන මගින් මූල්‍ය කාර්යසාධනයෙහි අග්‍රිම ශේෂයට බලපෑමක් සිදු නොවන බැවින් පෙන්වාදී ඇති පරිදි අග්‍රිම සැසඳීමේ ගිණුම සංශෝධනය කරගැනීමට කටයුතු කර ඇත. | -එම- |
| (ඇ) දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් ලැබීම් රු.50,354,051 ක් වුවද භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ලැබීම් රු.48,124,268 ක් වීමෙන් වූ වෙනස රු.2,229,783 ක් අක්මුදල් ගැලපුම් ගිණුමට බැර කළ යුතුව තිබුණි. එමෙන්ම දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් ගෙවීම් රු.45,636,931 ක් වුවද, භාණ්ඩාගාර පොත් අනුව එය රු.46,749,209 ක් වීමෙන් වූ වෙනස රු.1,112,278 ක් අක් මුදල් ගැලැපුම් ගිණුම බැර කළ යුතුව තිබුණි. ඒ අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් වශයෙන් එකතුව රු.3,342,061 ක් අක් මුදල් ගැලපුම් ගිණුම බැර කළ යුතු වුවද, රු.4,542,440 ක් බැර කිරීම හේතුවෙන් රු.1,200,380 ක් වැඩියෙන් අක් මුදල් ගිණුම බැර කර තිබුණි. | අක් මුදල් සැසඳීමේ ගිණුම පිළියෙල කිරීමේදී කළ යුතු ගැලපීම් පිළිබඳව පැවති ව්‍යාකූල තත්වය හේතුවෙන් අක් මුදල් ගැලපීම් ගිණුමට අත්තිකාරම් බී ගිණුමේ සටහන් ගැලපීම ද ව්‍යාකූල වී ඇත. ගැලපීම් සටහන් නිවැරදිව නොදැක්වීම මත අක් මුදල් ගැලපුම් ගිණුමේ නිරූපණය වන දෝෂය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි දක්වා ඇති ශේෂයට බලපෑමක් සිදු නොකරන බැවින් අක් මුදල් ගැලපුම් ගිණුම අදාල සටහන් ගලපා ගැනීමට කටයුතු කර ඇත. | -එම- |

## 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ සමෘද්ධි FM අන්තර්ජාල රේඩියෝ සේවාව සඳහා රු. 1,127,000 ක් වටිනා සන්නිවේදන උපකරන මිලදී ගැනීම් ස්ථාවර වත්කම් ලෙස දක්වා නොතිබුණි | දෙපාර්තමේන්තුවේ සමෘද්ධි FM අන්තර්ජාල රේඩියෝව සඳහා මිලදී ගත් රු 1,127,000 ක් වටිනා සන්නිවේදන උපකරණ වාර්තා කර ඇත්තේ 2509 වැය විෂය යටතේ මිලදී ගත් වත්කමක් ලෙස වන බැවින් එය ස්ථාවර වත්කම් වැය විෂයයන් යටතේ ගිණුම්ගත වී නැත. | ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය නොවන වත්කම් යටතේ වාර්තා කල යුතු වීම. |
| (ආ) | බණ්ඩාරවෙල සංචාරක බංගලාව පිහිටි අක්කර 1 ක භූමිය සහ නුවර කාර්යාල පරිශ්‍රය පිහිටි රූඩ් 1 යි පර්චස් 3.82 ක ඉඩම් නිත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු නොකර, මෙම ඉඩම් කොටස් පිළිවෙලින් රු. 20,000,000 ක් සහ රු. 21,900,000 කට තක්සේරු කර මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය මඟින් ලබාදී තිබූ උපදෙස් අනුව තක්සේරුවටිනාකම් ගිනුම් ගතකරන ලද අතර බණ්ඩාරවෙල සංචාරක බංගලාව පිහිටි ඉඩම මැනුම් කටයුතු සිදුකර මූලික පිඹුර ලද පසු පවරාදීමේ කටයුතු සිදු කරන ලද බව බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. මහනුවර ගැටඹේ උප කාර්යාල පරිශ්‍රය පිහිටි ඉඩම මෙතෙක් පවරා ගෙන නොමැත. | අදාළ ඉඩම් හා ගොඩනැගිලි දේපල අත්පත් කර ගැනීමේ හා පවරා ගැනීමේ කටයුතු අප්‍රමාදීව ඉටු කළ යුතු වීම. |
| (ඇ) | 1996-2013 වර්ෂය දක්වා කාලය තුළ දෙපාර්තමේන්තුවට පවරාගත් ඉඩම් 10 ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම. | එක් ඉඩමක් තක්සේරු කර ඇති අතර ඉඩම් 07 තක්සේරු කර ගැනීමට අදාළ කටයුතු කරමින් පවතී. එක් ඉඩමක් නායයාමට ලක්වන බවත් අනෙක් ඉඩම පිළිබඳ තොරතුරු ඉල්ලා ප්‍රාදේශිය ලේකම් වෙත ලිපි යවා ඇත. | ඉඩම් දෙපාර්තමේන්තුවට පවරා ගෙන තක්සේරු කර ගිණුම් ගත කළ යුතු වීම. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද රු. 741,844,910 ක ආදායම, මුදල් ප්‍රවාහ ප්‍රකාශයට රු. 85,734,851 ක් ලෙස දැක්වීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු. 656,110,059 කින් අඩුවෙන් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මුදල් පදනම මත එය පිළියෙල කිරීම හේතුවෙන් වෙනත් ශීර්ෂ වෙනුවෙන් හරස් සටහන් මඟින් එකතු කරන ලද ආදායම් වන රු 656,110,059 ක වටිනාකම අඩුකර මුදල් ලැබීම පමණක් සටහන් කර ඇත. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති මාර්ගෝපදේශ ප්‍රකාරව නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්, සහනාධාර හා මාරුකිරීම් සහ වෙනත් වැය ශිර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්වලට අදාළව, වැය ශිර්ෂ අනුව වියදම සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් ශේෂ නොගැලපීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැයකරන ලද මුදල් ප්‍රවාහය රු. 1,083,476,172 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මුදල් පදනම මත මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී නිරීක්ෂණයේ දැක්වෙන වැය විෂයන්හි හරස් සටහන් මඟින් වාර්තා කරන ලද වියදම අඩුකර මුදලින් වාර්තා වූ වියදම පමණක් දක්වා ඇත. | -එම - |
| (ඇ) | ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් අයකර ගැනීම් රු. 5,083,542 ක් සහ අත්තිකාරම් ගෙවීම් රු. 4,866,838 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අත්තිකාරම් බී ගිණුමෙහි මුදලින් අයකර ගැනීම් සහ මුදල් ගෙවීම් පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර ඇත. | -එම - |
| (ඈ) | භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම රු. 120,201,516 ක් වැඩියෙන් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී හරස් සටහන් මඟින් භාණ්ඩාගාරයට වාර්තා කරන ලද රු. 39,286,928 ක වටිනාකම අඩු කිරීමෙන් පසුව මුදලින් සිදු කරන ලද ගණුදෙනුව වන රු. 122,628,387 ක වටිනාකම ඇතුළත් කර ඇත. | -එම - |

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ඇප ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයින්ගේ තොරතුරු ඇතුළත් චක්‍රලේඛය නිකුත් කර ඇති අතර රජයේ නිලධාරීන්ගේ ඇප ලේඛනය පවත්වා ගෙන යාම ආරම්භ කර ඇත. | විධිවිධාන ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛණයක් පවත්වා ගත යුතු වීම. |
| **(ආ) හානි පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත. | -එම - |
| **(ඇ) වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලයිස්තු ගත කිරීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මු.රෙ.1647 අනුව වාහන ලේඛනය සකස් කිරීමට කටයුතු කරමින් පවතී. | -එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල නොකිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 7 කට අදාළව රු. 525,950,000 ක් වෙනත් වැය විෂයයන් සඳහා මාරු කර තිබුණි. | මෙම දෙපාර්තමේන්තුවට පැවරුණු විශේෂිත රාජකාරි හේතුවෙන් ඇතැම් වැය විෂයන්හි වියදම් අවශ්‍යතා ඉහළයාමත් හේතුවෙන් අභ්‍යන්තර ගැලපීම් සිදු කර | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කර වියදම් කළමනාකරණය කළ යුතු වීම. |

මු.රෙ.66 යටතේ ප්‍රතිපාදන මාරු කර ගැනීමට කටයුතු කරනු ලැබීය.

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 3 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළ සියළුම බැරකම් ඊළඟ වර්ෂයට ගෙන නොගොස් එම මුදල් වර්ෂය තුළදීම ගෙවා නිදහස් කළ යුතු බව දැක්වෙතත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට රු. 107,202,908 ක බැරකම් ඇතුළත් කර තිබුණි. තවද වැය විෂයයන් 13 ක රු. 1,801,065 ක ඉතිරි කිරීම් ඉක්මවා රු. 102,875,809 ක් බැරකම් ඇතිකර ගෙන තිබුණි. | 2020 වර්ෂයේ පළමු හා දෙවන කාර්තු අවසානයේදී පූර්ව දැනුවත් කිරීමකින් තොරව වාර්තා කරන ලද වියදමට වැය විෂය ප්‍රතිපාදනය සීමා කිරීම හේතුවෙන් වර්ෂ අවසානයෙහි මු.රෙ.66 මගින් මාරු කිරීම මගින් හෝ ගලපාගත නොහැකි වූ බැරකම් වාර්තා වූ අතර වැඩසටහන 02 හි 1101 ගමන් වියදම් වැය විෂයෙහි වාර්තා වූ බැරකම ඊට උදාහරණයකි. එම තත්වය පාලනය කරගත නොහැකිවූවක් බැවින් ප්‍රතිපාදන ඉක්ම වූ බැරකමක් වාර්තා වී ඇත. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව බැඳීම්වලට එළඹිය යුතු වීම. |
| (ආ) | දිස්ත්‍රික් කාර්යාල 5 කට අදාළ වැය විෂයයන් 9 ක් සම්බන්ධයෙන් එකතුව රු. 10,099,602 ක බැරකම් පිළිබඳ විස්තර බැරකම් ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. | අවසන් ගිණුමට බැරකම් ඇතුළත් කිරීමෙන් අනතුරුව වාර්තා වූ නිරීක්ෂණයේ සඳහන් බැරකම් ගිණුමට ඇතුළත්ව නොමැති බව පිළිගනිමි. එම බැරකම් ලේඛනගත කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලදී. | -එම- |

## 2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | විගණකාධිපතිවරයාට අවශ්‍යවන පරිදි නිශ්චිත කාල සීමාවක් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.7 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | පසුගිය වසර තුළ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමේ දී ප්‍රමාදයන් සිදුවූ බව පිළි ගනිමි. මේවනවිට සියළු විගණන විමසුම් සඳහා පිළිතුරු කෙටුම්පත් කර ඇති අතර කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | -එම- |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 381 (**i**) | පුහුණු මධ්‍යස්ථාන 03 ක භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව බැංකු ජංගම ගිණුම් පවත්වා ගෙනගොස් තිබුණි. | පුහුණු මධ්‍යස්ථාන 03 හි ජංගම ගිණුම් පවත්වාගෙන යාම සඳහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii)මුදල් රෙගුලාසි 189 සහ 486 | 2020 දෙසැම්බර් මස බැංකු සැසඳීම් ප්‍රකාශනය අනුව මාස 11 ක සිට වර්ෂ 3 ක් දක්වා කාල පරාසයක් ඇතුළත තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 11 කට අදාළව එකතුව රු. 1,895,569 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම නිරීක්ෂණයේ සඳහන් රු. 1,895,569 ක මුදල සහනාධාර ඉතිරි ලැබීම් සහ අත්තිකාරම් බී ගිණුමේ ලැබීම් දෙවරක් සටහන්වීම් ලෙස හඳුනාගෙන ඇති අතර ඒ අනුව නිවැරදි කිරීම් සිදු කිරීමට පියවර ගෙන ඇත. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1994 අගෝස්තු 3 දිනැති අංක 26/92(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහන 140 ක් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත.වාර්තාව කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2020 අගෝස්තු 18 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදය | අරමුදල් ලෙස ස්ථාපිත කර ඇති දිවිනැගුම අරමුදල, සමාජ ආරක්ෂණ භාර අරමුදල, නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල, බැංකු සංගම් ලිපි ද්‍රව්‍ය චක්‍රීය අරමුදල හා සේවක ණය චක්‍රීය අරමුදල පවත්වා ගෙනයාමේ අවශ්‍යතාවය සලකා බලා ඒවා ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2013 අංක 1 දරණ දිවිනැගුම (සමෘද්ධි ) පනතේ 45 වගන්තිය ප්‍රකාරව මෙම අරමුදල් ව්‍යවස්ථාපිත අරමුදල් බවට පත්ව ඇත. එම අරමුදල් නීත්‍යානුකූල කිරීමට මේ වනවිට කටයුතු කරමින් පවතී. | අරමුදල් පාර්ලිමේන්තු පනත් මඟින් ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වීම. |

**2.5 අවිධිමත් ගනුදෙනු**

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 ජුලි 14 දිනැති වෙළඳ ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 හි 1.1 ඡේදය ප්‍රකාරව මෝටර් රථ සහන බලපත්‍ර ලබාගැනීම සඳහා 2006 අප්‍රේල් 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 හි සඳහන් "ජ්‍යෙෂ්ඨ මට්ටමට" අයත් විධායක තනතුරක වසර 06 ක සක්‍රීය සේවාකාලයක් සම්පූර්ණ කර | කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/1284/Vi හා 2019.07.05 දිනැති ලිපියේ ඇමුණුම 01 හි අංක 13 යටතට ගැනෙන නිළධාරීන්ට පමණක් 2014.01.03 දින සිට මේ දක්වා සක්‍රීය සේවා කාලය වසර 06 ක් සම්පූර්ණ කර ඇත්නම් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්තිය 01/2018 හා එහි සංශෝධන | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති රාජ්‍ය නිලධාරීන් විය යුතුයි. එසේ වුවද එම චක්‍රලේඛයෙහි 2.3 ඡේදය ප්‍රකාරව සුදුසුකම් ලබන තනතුරකට පෞද්ගලික වන සේ හෝ අධි සේවක පදනම මත හෝ පත්කර ඇති නිලධාරීන් මේ සඳහා හිමිකම් නොලබන බව දක්වා තිබියදී ඒ පිළිබඳව අවධානය යොමු නොකොට පෞද්ගලික වන සේ තනතුරු ලැබූ කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වී ස්ථිර පත්වීම් නොලැබූ සහකාර අධ්‍යක්ෂ තනතුර දරන නිලධාරීන් 20 දෙනෙකු සඳහා 2020 පෙබරවාරි 26 දින සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දී තිබුණි. | යටතේ සහනදායි වාහන බලපත්‍රයක් ලබාදිය හැකි බව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක TIP/SS/01/129 හා 2020.02.26 දිනැති ලිපියෙන් දන්වා ඇත.<br><br>ඒ අනුව, ලබාදී ඇති අනුමැතිය ප්‍රකාරව කටයුතු කර ඇති බව දන්වා සිටිමි. | |

**2.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 18 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9 ඡේදය ප්‍රකාරව කාර්ය නිම වූ වහාම ලබාදුන් අතුරු අග්‍රිමය පියවිය යුතු නමුත් නිලධාරීන් 13 දෙනෙකුට අවස්ථා 20 කදී ලබාදුන් රු. 576,730 ක අත්තිකාරම් පියවීමට සති 02 ක සිට මාස 11 දක්වා කාල පරාසයක් ගතකර තිබුණි. | 2020 වර්ෂයේ තත්කාර්ය අතුරු අග්‍රිම පියවීම අවම වශයෙන් දින 07 ක කාලයක් ඇතුළත සිදුකිරීම සඳහා වන විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබිණි. එසේ වුවත් නියමිත කාලසීමාවන් තුළ අත්තිකාරම් පියවීම් ගිණුම්ගත කිරීමට නොහැකි විය. මෙම තත්වය පාලනය කර නියමිත පරිදි අත්තිකාරම් පියවීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් මේවනවිට ආරම්භ කර ඇත. | 2020 අගෝස්තු 18 දිනැති අංක 01/2020 දරන දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව කාර්ය නිම වූ වහාම ලබාදුන් අතුරු අග්‍රිමය පියවිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ හර ශේෂයේ උපරිම සීමාව රු. 350,000,000 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තත්‍ය ශේෂය රු. 47,656,425 ක් හෙවත් සියයට 13.6 ක් විය. එම සීමාව සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණයේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර ඉදිරියේදී අත්තිකාරම් බී ගිණුමෙහි සීමාවන් පිළිබඳ අවධානයෙන් සිට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නිලධාරීන් දැනුවත් කර ඇත. | සීමාවන් පිළිබඳ ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරීම කළයුතු වීම. |
| (ඇ) | සමෘද්ධි අධිකාරිය පැවති කාලයේදී නිලධාරීන්ට ණය ලබා දෙනු ලැබූ සේවක ණය චක්‍රීය අරමුදල අඛණ්ඩව පවත්වාගෙනයාම සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ උපදෙස් ලබා ගැනීමකින් තොරව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් නිකුත් කිරීම යටතේ 2020 වර්ෂයේදී නිලධාරීන් 302 කු සඳහා රු. 66,257,360 ක ආපදා ණය ලබා දී තිබුණි. මේ ආකාරයට සේවක ණය චක්‍රීය අරමුදලින් අඛණ්ඩව ණය ලබා දෙනු ලැබුවද, අරමුදල සඳහා 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වර්ෂ 8 ක මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2014 වර්ෂයෙහි ණය චක්‍රීය අරමුදලෙහි ගිණුම් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කරන ලදී. විගණනය විසින් පෙන්වා දී ඇති අඩුපාඩු සකස් කර ඒවා පිළියෙල කිරීමට සැළකියයුතු කාලයක් ගතවීම හේතුවෙන් ප්‍රමාදයක් පවතින නමුත් කඩිනමින් එම ගිණුම් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | භාණ්ඩාගාරයේ උපදෙස් ලබා ගැනීමටත් අරමුදලේ ගිණුම් විගණනයට ඉදිරිපත් කිරීමටත් කටයුතු කළයුතු වීම. |
| (ඈ) | 2020 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 220 දෙනෙකුගෙන් හිඟ හිට තිබූ අත්තිකාරම් ණය ශේෂය රු. 4,801,126 ක් විය. මෙම ණය ශේෂයේ, වර්ෂ 5 ක් ඉක්ම වූ ශේෂය රු. 751,999 ක් ද, වර්ෂ 4 ක සිට වර්ෂ 5 ක් අතර පැරණි ණය ශේෂය රු. 580,701 ක්ද, වර්ෂ 1 ක සිට වර්ෂ 3 ක් අතර හිඟ හිටි ණය ශේෂය රු. 3,434,065 ක් වශයෙන් අන්තර්ගතව පැවතුණි. | නිරීක්ෂණයෙන් දක්වා ඇති නිලධාරීන් 220 දෙදෙනා අයත්වන කාණ්ඩ 05කි. විශ්‍රාම හා මියගිය නිලධාරීන්ගේ විශ්‍රාම ලිපි ගොනු මේවන විට සකස් වෙමින් පවතින බැවින් ඒ අනුව එක් එක් නිලධාරියාගෙන් අයවිය යුතු මුදල් අයකිරීමට උපදෙස් ලබා දී ඇත. ස්ථාන මාරු නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීම කඩිනම් කිරීමට උපදෙස් ලබා දී ඇත. වැඩ තහනම් කල නිලධාරීන්ගේ විනය පරීක්ෂණ කටයුතු අවසන් කල | නිලධාරීන් සඳහා ණය නිකුත් කිරීම, ණය අයකර ගැනීම හා අයවිය යුතු ශේෂය ගණනය කිරීම යනාදිය නිවැරදිව සිදුකර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

විගස එම නිලධාරීන්ගෙන්ද අයවීමට ඇති මුදල් අයකර ගැනීමට කටයුතු යොදා ඇත.

## 2.7 තැන්පත් ශේෂයන්

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුහුණු මධ්‍යස්ථානවලින් රැස්කල ආදායම් රජයේ ආදායමට බැර කිරිමට කටයුතු නොකර එමඟින් වියදම් දැරීමෙන් අනතුරුව, ඉතිරි වූ මුදල් රු. 1,948,408 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගැනීමට කටයුතු කර තිබුණි. | පුහුණු මධ්‍යස්ථානයන්හි වියදම් දැරීම සිදු වන්නේ එම වැඩසටහන් සඳහා වෙන් කර ගනු ලබන පරිපාලන වියදමෙනි. පොදු තැන්පත් ගිණුමෙහි රඳවා තබාගනු ලබන්නේ එම පරිපාලන වියදම සඳහා වෙන් කරගනු ලබන කොටස වන අතර වසර දෙකක් අවසානයේ එම ශේෂය අදායමට බැර කිරීමට කටයුතු කරනු ලබයි.<br>2020 වර්ෂයේ සමනළවැව පුහුණු මධ්‍යස්ථානය කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස පවරා ගැනීම හේතුවෙන් එම මධ්‍යස්ථාන ගිණුමෙහි පැවති ශේෂය තැන්පත් ගිණුමට මාරු කරනු ලැබූයේ නැවත මධ්‍යස්ථානය පවරා ගැනීමෙන් අනතුරුව පරිපාලන වියදම සහ රජයේ ආදායම ගණනය කර ගිණුම් තැබීමේ අරමුණෙනි. | නියමිත කාර්යය සඳහා නීතියෙන් වෙන් කරනු නොලැබෙන සියලුම ලැබීම් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර පුහුණු මධ්‍යස්ථාන නඩත්තු කිරීම සඳහා අයවැය ප්‍රතිපාදන වෙන් කරගත යුතු වීම. |
| (ආ) | 2013 අගෝස්තු, සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසයන්හි සමෘද්ධි සහනාධාර ගෙවීම සඳහා බැංකු මූල්‍ය අංශයෙන් ලබාගත් රු. මිලියන 2,374 ක මුදල පියවිය යුතු බැරකමක් වුවද, එය බැරකම් ලෙස හෙළිදරව් නොකොර එය දිගින් දිගටම පොදු තැන්පත් ගිණුමේ ශේෂයක් ලෙස පෙන්වා තිබුණි. | මෙම ශේෂය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට පැවරී ඇත්තේ එවකට සමෘද්ධි කොමසාරිස් දෙපාර්තමේන්තුවෙහි තැන්පත් ගිණුමෙහි පැවති ශේෂයක් ලෙසය. මෙය සහනාධාර වැය විෂය බැරකමක් ලෙස ගිණුම්ගත කර නොමැත්තේ ප්‍රවර්තන වර්ෂයේදී සහනාධාර සඳහා වූ | බැරකම පියවා ගැනීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගත යුතු බව හා ගිණුම්වලින් නිවැරදිව හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | වියදම සමෘද්ධි අධිකාරියෙන් ලබාගත් මුදලින් පියවීම හේතුවෙන් වැය විෂය බැරකමක් වාර්තා නොවීම හේතුවෙනි. ඒ අනුව අදාල ශේෂය තෙවන පාර්ශවයකට නිරවුල් කළ යුතු බැදීමක් ලෙස තැන්පත් ගිණුමෙහි රදවා ඇත. | |
| (ඈ) | ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අංශය මඟින් විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලවලට ලබා දී තිබූ මුදලින් 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරි වී ආපසු එවා තිබූ රු. 2,955,664 ක් එම අංශයට නිරවුල් කිරීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | 2020 වර්ෂයේ අක් මුදල් ලැබීමේ පැවති පසුබෑම් හේතුවෙන් අත්‍යවශ්‍ය ගෙවීම් සඳහා මුදල් පොතේ ශේෂය යොදා ගැනීමේදී තැන්පත් ගිණුමට අදාල මෙම මුදල් වලින්ද වියදම් දරා තිබීම හේතුවෙන් නිරවුල් කිරීම් හඳුනා ගන්නා අවස්ථාවෙහි ප්‍රමාණවත් මුදලක් නොවීය. මේ පිළිබඳ භාණ්ඩාගාරය දැනුවත් කර අක් මුදල් ඉල්ලුම් කළ ද එසේ ඉල්ලුම් කරන ලද අක් මුදල් නොලැබුණු බැවින් මෙම ශේෂය ක්ෂුද්‍රමූල්‍ය අංශයට නිරවුල් කිරීමට නොහැකි වී ඇත. | වර්ෂය අවසන් වන විට තථ්‍ය වියදම හඳුනාගෙන නිවැරදිව පියවීම කළ යුතු වීම. |
| (ඈ) | 2017 ජනවාරි සිට 2018 දෙසැම්බර් දක්වා කාලය තුළ නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ එකතුව රු. 497,375 ක් වූ කල් ඉකුත් වූ චෙක්පත් 66 ක් මුදල් රෙගුලාසි 396 (අ) ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු නොකර, පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව කල් ඉකුත් වූ චෙක්පත් වසර 02 ක කාලයක් තැන්පත් ගිණුමේ රඳවා ගෙන රජයේ ආදායමට බැර කිරීමට ඇති ප්‍රතිපාදනය මත රඳවාගෙන ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | 2018 ඔක්තෝබර් සිට 2019 නොවැම්බර් 25 දක්වා කාලය තුළ අවස්ථා 26 කදී දෙපාර්තමේන්තු නිල බැංකු ගිණුමට බැර වී තිබූ රු. 1,338,012 ක් මූල්‍ය ප්‍රභවයන් හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු නොකොට පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | මෙම මුදල් ශේෂ තැන්පත් ගිණුමෙහි රඳවා ඇත්තේ ඒවා බැරවිය යුතු මූල්‍ය ප්‍රභවය සොයා මාරු කිරීමේ සහ එසේ මූල්‍ය ප්‍රභවය හඳුනා ගැනීමට නොහැකි සියළු සෘජු බැර රජයේ ආදායමට මාරු කිරීමේ අරමුණිනි. | මූල්‍ය ප්‍රභවයන් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමෘද්ධි ප්‍රතිලාභින්ගේ දායක මුදලින් ගොඩ නැගී ඇති ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අංශය හා සමාජ ආරක්ෂක අරමුදලේ විවිධ ගනුදෙනු භාණ්ඩාගාර අනුමැතිය ලබා නොගෙන පොදු තැන්පත් මඟින් සිදු කිරීම සම්බන්ධයෙන් පසුගිය වර්ෂයන්හි විගණනය මඟින් කරුණු පෙන්වා දෙනු ලැබුවද ඒ කෙරෙහි අවධානය යොමු නොකොට 2020 වර්ෂයේදී ද ගනුදෙනු පොදු තැන්පත් ගිණුම මඟින් සිදුකර තිබුණි. එම ගනුදෙනුවලින් අනතුරුව 2020 දෙසැම්බර් 31 දිනට ක්ෂුද්‍ර මූල්‍ය අංශයට පියවිය යුතු රු. 79,342,047 ක් ද සමාජ ආරක්ෂක අරමුදලට පියවිය යුතු රු. 428,940 ක් ද වශයෙන් එකතුව රු. 79,770,987 ක ශේෂයක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | සමෘද්ධි සංවර්ධන දෙපාර්මේන්තුවෙහි ස්වාධීන අරමුදල් වන බැවින් එම පදනම මත ක්ෂුද්‍රමූල්‍ය බැංකු අංශයේ සහ සමාජ ආරක්ෂණ අරමුදලේ ලැබීම් තෙවන පාර්ශවයන් සඳහා ගෙවීම් කරනු ලබන තැන්පත් ගිණුම් කාණ්ඩය යටතේ ගිණුම් ගත කර අදාල ගිණුම් කටයුතු සිදු කර ඇත. | භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නිවැරදිව පියවීම කළ යුතු වීම. |
| (උ) | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ වූ නිලධාරීන්ට ගෙවිය යුතු වන්දි පාරිතෝෂික මුදල් සමෘද්ධි බැංකු සමිතිවල අරමුදල් වලින් ගෙවා තිබුණි. එලෙස ගෙවූ මුදල් නැවත සමෘද්ධි බැංකු සමිති සඳහා ප්‍රතිපූර්ණය කිරීම සඳහා 2019 දෙසැම්බර් 31 දින භාණ්ඩාගාරයට පියවිය යුතු ඉතිරි මුදලින් රු. 84,296,720 ක රඳවාගෙන පොදු තැන්පත් ගිණුමට බැර කර වර්ෂයකට අධික කාලයක් ගත වී තිබුණද නැවත බැංකු සමිතිවලට ප්‍රතිපූර්ණය කිරීමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේ මැයි මස වැටුප් ගෙවීම සඳහා අක්මුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් භාණ්ඩාගාරයෙන් හිග අක්මුදල් ලබාගන්නා තෙක් මෙම මුදල් වැටුප් ගෙවීම සඳහා යොදා ගන්නා ලදී.මෙම කාරනය සඳහන් කර වැටුප් සඳහා අවශ්‍ය ඉතිරි අක්මුදල් එම අවස්ථාවෙහි ඉල්ලුම් කළ ද භාණ්ඩාගාරය විසින් එම අක්මුදල් ලබා නොදුන් අතර 2020.12.31 දින ගිණුම් පියවීමට පූර්වයෙන් ද ඉල්ලීම් කළද අදාල මුදල් නොලැබීම මත මෙම ශේෂය නිරවුල් කිරීමට නොහැකි විය. 2021 වර්ෂයේ දී අදාල ගෙවීම් කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් දී ඇත. | බැංකු සමිතිවලට ප්‍රතිපූර්ණය කිරීමට හෝ රාජ්‍ය ආදායමට බැරකිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | තෙවන පාර්ශවයන්වෙත ගෙවීම් සඳහා තාවකාලිකව රඳවාගන්නා තැන්පතු ගිණුමේ දෙසැම්බර් 31 දිනට රු. 2,556,871,700 ක් වූ ශේෂය තුළ වර්ෂ 8ක සිට වර්ෂ 10 ක් අතර කාලයක් පැරණි තැන්පතු ශේෂය රු. 2,374,500,000 ක් විය. | මෙම ශේෂය පියවීම සඳහා අවස්ථා ගණනාවකදී භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කරනු ලැබුව ද මෙතෙක් ඊට අවශ්‍ය අක් මුදල් හෝ ප්‍රතිපාදන නොලද බැවින් තවදුරටත් තැන්පත් ගිණුමේ ශේෂයක් ලෙස සටහන් වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 දැක්ම හා මෙහෙවර**

--------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1995 වර්ෂයේදී ආරම්භ කර තිබූ සමෘද්ධි සහනධාර වැඩසටහන මඟින් දිළිදුකම තුරන් කර ප්‍රජාව සවිබල ගැන්විය හැකි නිශ්චිත නිර්ණායක හඳුනාගෙන ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ඉලක්කගතව වැඩසටහන් මෙහෙය විමටත්, අවශ්‍ය දැනුවත් කිරීම් සිදුකර ප්‍රජාව සමඟ තොරතුරු හුවමාරු කර ගැනීමේ තොරතුරු පද්ධතීන් හඳුන්වා දීමටත් කටයුතු කර නොතිබූ අතර සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීම අරමුණු කරගෙන පිහිටුවා තිබූ 1,074 ක් වූ ප්‍රජාමූල බැංකු පද්ධතිය එම අරමුණෙන් බැහැරව ලාභ ඉපැයීම අරමුණු කරගනිමින් මෙහෙයවමින් තිබුණි. 2013-2020 වර්ෂ 08 ක කාලය තුළ රජයේ සමෘද්ධි සහනාධාර වියදම රු. මිලියන 300,364ක් ද සමෘද්ධි සංවර්ධන වියදම රු. මිලියන 7,413 ක් ද විය. සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ඉදිරි සංවර්ධන වැඩසටහන් හඳුනා ගැනීමට | ව්‍යාපෘතිවල සාර්ථකත්වය යනු සවිබලගැන්වි ඇති සමෘද්ධිලාභියා වේ. ඒ අනුව සවිබලගැන්වි ඇති සමෘද්ධිලාභින් හඳුනා ගැනිමේ ක්‍රමවේදයක් දෙපාර්තමේන්තු වෙත නොතිබූ, නමුදු 2020 වසරේදි මේ සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කෙරිණි. | දිළිදුකම තුරන් කර ප්‍රජාව සවිබල ගැන්විය හැකි නිශ්චිත නිර්ණායක හඳුනාගෙන ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ඉලක්කගතව වැඩසටහන් මෙහෙය වීමට කටයුතු කළ යුතු වීම. |

ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

## 3.2 සැලැසුම් කිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබීම හේතුවෙන් පහත අඩුපාඩු නිරීක්ෂණය විය. | | |
| (අ) | ප්‍රජාමූල බැංකු සහ දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශවලට අදාල සමස්ථ කාර්යභාරය ඇතුළත් වන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කල යුතු වුවත්, ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ රු. මිලියන 194.58 ක ප්‍රතිපාදන සඳහා අපේක්ෂිත ක්‍රියාකාරකම් පමණක් ඇතුළත් කර සැලැස්මක් සකස් කර තිබුණි. එම ප්‍රතිපාදනවලින් රු. මිලියන 97.47 ක් හෙවත් සියයට 50.09 ක් 2019 වර්ෂයේ අතැති බිල්පත් හා අවිච්ඡේද ව්‍යාපෘති සඳහා වෙන්කර තිබුණි. | 2020 ක්‍රියාකාරී සැලැස්ම සඳහා දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැය විෂයට අදාලව වෙන් කරන ලද රු.මි.194.58 ක ප්‍රතිපාදන සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අමතරව, ප්‍රජාමූල බැංකු අංශයේ සැලැස්ම, සමාජ ආරක්ෂණ අංශයේ සැලැස්ම, නිවාස ලොතරැයි වැඩසටහනේ සැලැස්ම , අභ්‍යන්තර විගණන සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම ද ඇතුළු සියළු තොරතුරු ඇතුලත් සම්පූර්ණ වාර්තාව මේ වනවිට සකස් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්යභාරය ඇතුළත් වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කර මනා කළමනාකරණයකින් යුතුව ඉලක්කයන් ළඟාකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළයුතු වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සහ සංවිධාන සටහන අන්තර්ගත වී නොතිබුණි. | වාර්ෂික අක්මුදල් අවශ්‍යතා සැලැස්ම ඒ තුල අන්තර්ගත නොවූ අතර, එය ඉදිරි සැලසුම් වලදී ඇතුලත් කිරීමට කටයුතු කරන බව ද සඳහන් කරනු කැමැත්තෙමි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර මනා කළමනාකරණයකින් යුතුව ඉලක්කයන් ළඟාකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. |

**3.3 කාර්යභාරයන් ඉටු නොකිරීම**

---------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහන මඟින් මාතලේ පල්ලේපොල දෙමදඹය ගම්මානයේ කිරිගව පාලනය සඳහා ප්‍රතිලාභීන් 50 ක් මුල්කර ගෙන සමාලෝචිත වර්ෂයේදී ලබා ගත් ප්‍රතිපාදිත රු. 1,820,000 ක මුදලින් කොත්මලේ ආයතනයට ගවගාල් ඉදිකිරීම වෙනුවෙන් රු. 1,000,000 ක් ගෙවා තිබුණි. කිරි ගවයින් ලබාදීමට එකඟ වූ සැපයුම්කරු විසින් කිරිගවයින් ලබා නොදීම, උපකරණවල මිල වැඩිවීම මත ප්‍රතිලාභීන් එම උපකරණ ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය නතර වී තිබුණි. | 2020 වසරේ රටේ පැවති තත්ත්වය හමුවේ අතැති බිල්පත් සඳහා අක් මුදල් ඔවුන් වෙත ලැබී ඇත්තේ මැයි මාසයේදී වන බැවින් ඔවුන් විසින් කිරි ගවයින් මිලදී ගැනිමට එකහවී සිටි සේරුදණ්ඩාපොල කිරි ගම්මානයේ කිරි ගවයින් ඒ වන විට අලෙවි වී ඇත. එමෙන්ම මුදල් ලැබෙන විට කිරි උපකරණ වල මිල වැඩිවීම මත ප්‍රතිලාභීන් එම උපකරණ ලබා ගැනිම ප්‍රතික්ෂේප කර තිබිණි. | සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීමේ සංවර්ධන වැඩසටහන් සඳහා සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වීම. |

**3.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේදී රු. 5,133,875 ක් වැයකර නිමකරන ලද සුවබොජුන්හල් 2 ක් සහ 2020 වර්ෂයේදී රු. 11,314,925 ක් වැය කර නිමකරන ලද සුවබොජුන්හල් 4 කින් සමාලෝචිත වර්ෂයේදී හම්බන්තොට සුවබොජුන්හල පමණක් විවෘත කර තිබුණි. | 2019 වර්ෂයේ මුදල් වැය කරන ලද සුව බොජුන්හල් 02ට අදාල බිල්පත් ගෙවීම් 2020 වර්ෂයේ අවසන් කළද කොවිඩ් 19 හේතුවෙන් වසර අවසානයේ විවෘත කිරීමට නොහැකි විය. | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අම්පාර මහඔය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් අක්කර භාගයකින් යුතු භූමියක එකතුව වර්ග අඩි 5218 කින් යුත් මහල් 2 කින් යුත් සුව බොජුන් හල් සහ සමෘද්ධි ගිමන්හලක් සහිත ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට අදාළ පලමු අදියර 2017 වර්ෂයේ ආරම්භ කර තිබුණි. 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා එකතුව රු. 43,457,347 ක් ලෙස ඇස්තමේන්තු කර තිබූ අතර 2020 වර්ෂය දක්වා රු. 35,042,514 ක් ප්‍රධාන කාර්යාලයෙන් දිස්ත්‍රික් කාර්යාලයට ප්‍රතිපාදන වෙන් කර තිබුණි. පලමු හා දෙවන අදියර සඳහා කොන්ත්‍රාත්කරු වෙත රු. 13,812,142 ක් ගෙවා තිබූ නමුත් දෙවන අදියර නිමකර 2018 වර්ෂයේදී බාරදිය යුතු වුවත් 2021 වර්ෂය වනතෙක්ම නිම කිරීම් සිදුකර නොතිබුණි. | අම්පාර මහඔය අලෙවි මධ්‍යස්ථානය හා සුව බොජුන්හල ඇස්තමේන්තු කර ආරම්භ කරන ලද්දේ 2017 වර්ෂයේදීය. 2020 වර්ෂය සඳහා ප්‍රතිපාදන යොමු කළද, කොවිඩ් 19 හා අධික වර්ෂාපතනය හේතුවෙන් අදාල ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට නොහැකි තත්ත්වයක් උදාවිය. මෙම ව්‍යාපෘතියේ වැඩ 2021 වර්ෂයේ අවසන් කිරීමට බලාපොරොත්තු වන බැවින් රු. මිලියන 14.8ක ප්‍රතිපාදන හා අක් මුදල් අම්පාර දිස්ත්‍රික් ලේකම් විසින් ඉල්ලා ඇත. | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වීම. |

## 3.5 කොවිඩ් - 19 සමාජ ප්‍රතිලාභ රු. 5000 දීමනා ගෙවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රතිලාභ හිමිවූ කාණ්ඩායම් 5 සඳහා අදියර I හා II යටතේ පවුල් 10,021,055 ක් සහ ආබාධිත, වකුගඩුරෝග වැඩිහිටි ප්‍රතිලාභීන් 71,383 ක් සඳහා රු. මිලියන 50,462.19 ක් ද, නිලධාරීන් වෙනුවෙන් වක්‍ර වියදම් සඳහා රු. මිලියන 34.63 ක් ද , බැංකු ණය පොලී ලෙස රු. මිලියන 542.10 ක් ද, ඇතුළුව එකතුව රු. මිලියන 51,038.92 ක් වැය දැරීමට අදාළව පහත කරුණු නිරීක්ෂණය විය. | | |

| | | | |
|---|---|---|---|
| (අ) | ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙන් ඉදිරිපත්කල තොරතුරු අනුව ඉහත සඳහන් සහනාධාර ගෙවීමට අවශ්‍ය මුදල් ලබා ගැනීම බැංකු ණය (ස්ථාවර තැන්පත් ඇපයට තබා) මඟින්ද, ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අංශයේ ආයෝජන උපලබ්ධි කිරීම, ක්ෂුද්‍රමූල්‍ය අංශයේ ඉතිරි කිරීම් සහ සමෘද්ධි බැංකු මඟින් ද එකතුව රු. මිලියන 53,588.96 ක් ලබාගෙන තිබුණි. මෙම ප්‍රතිපාදනවලින්, නිල බැංකු ගිණුම මඟින් රු. මිලියන 34,225.63 ක් ද සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම මඟින් රු. මිලියන 7,893.26 ක් ද සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු වලින් සෘජු ගෙවීම් රු. මිලියන 11,363.32 ක්ද වශයෙන් එකතුව රු. මිලියන 53,482.21 ක් ප්‍රජා මූල බැංකු වෙත ප්‍රේෂණය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් විධිමත්ව තොරතුරු නඩත්තු කර නොතිබූ අතර උපයෝජනය කරන ලද මුදලින් ප්‍රාදේශීය කාර්යාලවල වියදම හා ඉතිරි මුදල් සැසඳීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | රු 5.000 ක දීමනාව ගෙවීමෙන් අනතුරුව සමෘද්ධි බැංකු විසින් යොමු කරන ලද ඉතිරි ලැබීම් සියල්ල පොදුතැන්පත් ගිණුමෙහි ලැබීම් ලෙස ගිණුම්ගත කර වාර්තා කිරීම් සිදු කර ඇත. එම ලැබීම් සියල්ල තැන්පත් ලේඛනවල සටහන් කිරීම ද සිදු කර ඇත. ප්‍රාදේශීය කාර්යාල වියදම හා ඉතිරි මුදල් සැසඳීම් සිදුකර වාර්තා කරන ලෙස දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇත. | විධිමත්ව තොරතුරු නඩත්තු කර උපයෝජනය කරන ලද මුදල් හා ඉතිරි මුදල් සැසඳීම් කිරීමට කටයුතු කලයුතු වීම. |
| (ආ) | ස්ථාවර තැන්පතු 31 ක ආයෝජනය කර තිබූ සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් රු. මිලියන 22,754 ක් ආයෝජන කල්පිරීමට පෙර උපලබ්ධි කර ගැනීම නිසා සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා ලැබිය යුතු රු. මිලියන 556.46 ක පොළී මුදල් අහිමි වී තිබුණි. | නිරීක්ෂණය හා එකග වෙමි. | සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් ආයෝජන සඳහා අහිමි වූ පොළී මුදල් ලබාදීමට කටයුතු කලයුතු වීම. |
| (ඇ) | විවිධ මූලාශ්‍රවලින් ලබාගත් මුදලින් වියදම්කල රු. මිලියන 51,038.92 ක මුදලින් බැංකු ණය මුදල රු මිලියන 16,000 ක් හා ඒ මත පොලිය රු. මිලියන 542.10 ක් පමණක් භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය වී තිබුණු අතර ඉතිරි මුදල් පියවන ආකාරය පිළිබඳ තහවුරු කිරීම් ඉදිරිපත් නොවීය. | ක්ෂුද්‍රමූල්‍ය අංශයේ ණය පියවා ගැනීම සඳහා රු.බිලියන 24 ක ප්‍රතිපාදනයක් නිදහස් කර තිබුණ ද ඊට අදාල අක් මුදල් නොලැබීම හේතුවෙන් දෙසැම්බර් මස දී එම මුදල පියවා ගැනීමට නොහැකි විය. අදාල මුදල් ප්‍රතිපූරණය කර දෙන ලෙස මේ වනවිට අවස්ථා ගණනාවක දී භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ඇත. | ඉතිරි මුදල් පියවීමට කටයුතු කලයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පොරොත්තුගත වැඩිහිටි තැනැත්තන්, අබාධිත හා වකුගඩු රෝගීන් සඳහා වූ රු. 5,000 ක දීමනාව සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති හරහා ගෙවීමට ලබාදී තිබූ උපදෙස් අනුව එම ප්‍රතිලාභීන් 71,383 දෙනෙකු සඳහා රු. 356,915,000 ක් සියළුම ප්‍රජාමූල බැංකු සමිතිවල නිලගිණුමට බැර කිරීමෙන් අනතුරුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබාදී තිබුණි. 2020 මැයි 01 දිනැති අංක DSD/03/ACC/8/IMP/2020 දරන සමෘද්ධි දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරීගේ ලිපිය ප්‍රකාරව ගෙවීම් සිදුකර අවසන් වූ පසු ඉතිරි මුදල් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිල ගිණුමට බැර කර රිසිට්පත් ප්‍රධාන කාර්යාලයට ෆැක්ස් කරන ලෙසත් ගෙවීම් වලට අදාළ ප්‍රගතිය සමාජ සේවා නිලධාරී සහ වැඩිහිටි ප්‍රවර්ධන නිලධාරී විසින් ඒකාබද්ධ වාර්තාවක් සකස්කර ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියෙන් දෙපාර්තමේන්තුවට එවන ලෙස ද දන්වා තිබුණද අදාළ වාර්තා හෝ ඉතිරි මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම නිරීක්ෂණයේ සඳහන් වැඩිහිටි, ආබාධිත සහ වකුගඩු රෝගීන් සඳහා කරන ලද ගෙවීම් සඳහා දරණ ලද රු 356,915,000 ක මුදල මෙම දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපූරණය කර දෙන ලෙස ඉල්ලා 2021 මාර්තු 19 දිනැතිව අබාධ සහිත තැනැත්තන් සඳහා වූ මහ ලේකම් කාර්යාලය වෙත ලිපියක් යොමු කර ඇත. | ගෙවීම් සිදුකර අවසන් වූ පසු ඉතිරි මුදල් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිල ගිණුමට බැර කර ගෙවීම් වලට අදාළ ප්‍රගතිය පිළිබඳ වාර්තා ලබා ගැනිමට කටයුතු කළ යුතු වීම. |

**3.6** **අනාර්ථික ගනුදෙනු**

---------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------ | -------------------- | --------- |
| අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පරිහරණය සඳහා මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ 2018 බදු රහිත මාසික කුලිය රු. 198,000 බැගින් වසර 5 ක කාලයක් සඳහා රු. 11,880,000 ක ගිවිසුම්ගත වටිනාකමකට වාහනයක් ලබා ගෙන තිබියදීත් 2018 මාර්තු මාසයේදී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පරිහරණය සඳහා වාහනයක් මිලදී ගෙන තිබුණි. ඒ අනුව කල්බදු වාහනයක අවශ්‍යතාවයක් නොවූ හෙයින් ගිවිසුම අහෝසිකර වාහනය නැවත බාරදීමට 2018 සහ 2020 වර්ෂවල උත්සාහ කර තිබුණද | පිළිතුරු ලබා දී නොමැත. | දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් අරපිරිමැසුම්දායීව හා කාර්යක්ෂමව යෙදවිය යුතු වීම. |

ගිවිසුමෙන් ඉවත් වීමට නොහැකි ආකාරයට කොන්දේසි ඇතුළත් කර තිබීම හේතුවෙන් එය අවලංගු කල නොහැකි වී තිබුණි. එම නිසා වාහන ධාවනය නොකිරීම හේතුවෙන් 2018 අප්‍රේල් මස සිට 2020 පෙබරවාරි මාසය දක්වා ගෙවා ඇති රු. 4,918,320 ක මුදල සහ 2020 මාර්තු සිට 2021 ජනවාරි දක්වා රු. 2,352,240 ක බැරකම සමඟ එකතුව රු. 7,270,560 ක මුදල නිශ්කාර්ය වියදමක් විය.

## 3.7 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන විමසුම පිළිබඳ විස්තරය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 7 හා සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 3 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, ප්‍රමාද කාලය මාස 5 ක සිට මාස 20 ක් ඉක්ම වූ කාල පරාසයක් වි තිබුණි. එම විමසුම්වලට අදාළව ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. මිලියන 13,814 ක් විය. | කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් 2020 වසරෙහි මාර්තු සිට ජූලි දක්වා කාලසීමාව තුළ කාර්යාල වසා තැබීමත්, නිලධාරීන් සේවයට නොකැඳවීමත් සිදුවිය.ඉන් අනතුරුව සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලසීමාව තුළ ද වසංගත තත්වය හේතුවෙන් බොහෝ කාර්යයන් සීමා කිරීමට සිදුවිය.පසුගිය වසර තුළ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමේ දී ප්‍රමාදයන් සිදුවූ බව පිළි ගනිමි. මේවනවිට සියළු විගණන විමසුම් සඳහා පිළිතුරු කෙටුම්පත් කර ඇති අතර කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව ගණන් දීමේ නිලධාරියා විසින් මුදල් රෙගුලාසි 452(1) හි සඳහන් විගණන විමසුම් ලේඛනය පරීක්ෂා කර පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර විගණන විමසුම්වලට වහාම පිළිතුරු ලබා දිය යුතු වීම. |

## 3.8 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------ | ------------------------ |
| (අ) | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2018 අප්‍රේල් 05 දින අනුමත කරන ලද විධායක සේවා ගණය සඳහා වන උසස් කිරීමේ පටිපාටියට අනුකූලව විශ්‍රාම වැටුප් හිමිකම සහිතව මනාපය පලකළ නිලධාරීන් 20 දෙනෙකු සඳහා 2013 අංක 01 දරන දිවි නැගුම පනතේ 44 (ඉ) II වගන්තියේ විධිවිධාන හා අධ්‍යක්ෂ ජනරාල් විසින් 2019 අප්‍රේල් 4 දිනැතිව නිකුත් කරන ලද 3/2019 දරන චක්‍රලේඛයේ සියළුම කොන්දේසිවලට හා විධිවිධානවලට යටත්ව දරන්නාට පෞද්ගලික වන සේ 2014 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි විධායක සේවා ගණයේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර 2019 ජුලි 31 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්වීම් ලිපි නිකුත් කර තිබුණි. වසර 3 ඉක්මවීමට පෙර පැවැත්විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද පවත්වා නොතිබියදී 2019 ජුලි 05 දිනැති අංක DMS/1284/VI දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය මඟින් අදාළ නිලධාරීන් සඳහා **"**දරන්නාට පෞද්ගලික වන සේ**"** යන්න ඉවත්කර නැවතත් තනතුරු අනුමත කිරීම පිළිබඳ වූ ගැටළුකාරී තත්ත්වය නිරාකරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙහි සඳහන් කර ඇති පත්වීම් ලිපියෙහි ගැටළුකාරී තත්වය නිරාකරණය කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත 2021.02.16 දිනැති ලිපිය මඟින් කරුණු ඉදිරිපත් කර ඇත. | ගැටළුකාරී තත්ත්වය නිරාකරණය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | අධිකාරීවල නිලධාරීන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය හා උසස්වීම් පිළිබඳ 2019 අප්‍රේල් 4 දිනැති අංක 3/2019 දරන සමෘද්ධි දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ **"**ආ**"** ප්‍රකාරව කටයුතු නොකල අවස්ථා පහත පරිදි නිරීක්ෂණය විය. | | |
| **i.** | උක්ත චක්‍රලේඛයේ 3 (1) **i** ඡේදය ප්‍රකාරව දිවිනැගුම පනතේ 44 (ඉ) **ii** | පිළිතුරු ලබා දී නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වගන්තිය යටතේ අධිකාරියක මුල් පත්වීමේ දින සිට විශ්‍රාම වැටුප් හිමිකම සහිතව දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වන නිලධාරින් එම අධිකාරියේ මුල් පත්වීම් දින සිට තම ගිණුම අවසන් කරන දිනය දක්වා සේවක අර්ථ සාධක අරමුදලේ තමා නමින් තිබූ සම්පූර්ණ මුදලින් සියයට 60 ක් වන රාජ්‍ය දායකත්වය ආපසු රජයට ගෙවිය යුතු බව දැක්වෙතත් එම මුදල් අයකර ඇති බවක් නිරීක්ෂණය නොවීය. | | |
| **ii.** | 1982 අංක 12 දරණ පාරිතෝෂික පනත යටතේ පාරිතෝෂිකයක් ලබාගෙන ඇත්නම් එම ලබාගත් සම්පූර්ණ මුදලම ආපසු රජයට ගෙවිය යුතු වේ. (උක්ත චක්‍රලේඛයේ 5 ඡේදය) එම මුදල වෛකල්පිත විශ්‍රාමයාමේ වයසට එළඹෙන වයස අවු 55 පිරෙන දිනට පෙර වාරික 60 කට නොවැඩි වාර ගණනකින් වැටුපෙන් අයකිරීමටත් එසේ නොහැකි වූ විට අයකරගත යුතු සම්පූර්ණ මුදලින් හරි අඩකට නොවැඩි මුදලක් පරිවර්තිත විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට අවස්ථාව සලසා දිය හැකි බවත්, අයකල යුතු සම්පූර්ණ මුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට විශ්‍රාම වැටුප් අයදුම්පත් යවන දිනට ගෙවා අවසන් කර තිබිය යුතු විය. එහෙත් විශ්‍රාම ගිය නිලධාරීන්ගේ හැර අනෙකුත් සියළුම නිලධාරීන්ගේ පාරිතෝෂික මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. ගිණුම් අංශයේ තොරතුරු අනුව 2020 දෙසැම්බර් 31 දිනට ගෙවා තිබූ මුළු පාරිතෝෂික මුදල රු. 2,214,097,760 ක් ද ඒ සඳහා සියයට 30 ක අධිභාර මුදල රු. 843,160,700 ක් ද වශයෙන් එකතුව රු. 3,057,258,460 ක් ගෙවා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2030 වර්ෂය වන විට දුගීබවින් තොර සමෘද්ධිමත් රටක් බවට ශ්‍රී ලංකාව පත් කර ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දී ඇති තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා දර්ශකවලට අනුකූලව සැලසුම් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනාගෙන ඒ අනුව කටයුතු කළ යුතු වීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| | 2020 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්යමණ්ඩලය පිළිවෙලින් 26,431 ක් හා 25,255 ක් වූ අතර තනතුරු 1,178 ක් පුරප්පාඩු පැවතුණි. දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 12,823.44 ක් වැයකර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (අ) | විශ්‍රාම වැටුප් හිමිකම් රහිත සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට හා සේවක අර්ථ සාධක අරමුදලට අඛණ්ඩව දායකත්වය දරමින් දෙපාර්තමේන්තු සේවයට | පිළිතුරු ලබා දී නොමැත. | කටයුතු කඩිනම් කර පරිපාලන ගැටළු විසදා ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | එක්වීමට කැමැත්ත පල කල නිලධාරීන් 4 දෙනෙකු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර තිබූ නමුත් උසස්වීම් පරිපාටිය අනුමත කර අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට 2020 දෙසැම්බර් මස දක්වා කටයුතු කර නොතිබුණි. එම නිලධාරීන් සහකාර අධ්‍යක්ෂ තනතුරෙහි රාජකාරි කටයුතු ඉටුකරමින් පැවතුණි. | | |
| (ආ) | සමෘද්ධි කළමනාකරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය අනුව සියයට 30 ක් විවෘත තරඟ විභාගයක් මගින්ද සියයට 70 ක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ **MN – 1** හා **MT – 01** වැටුප් බාණ්ඩ යටතේ වැටුප් ලබන නිලධාරින්ගෙන් විවෘත තරඟ විභාගයක් මගින් ද බඳවාගත යුතුය. එසේ වුවත් 2020 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු වූ තනතුරු 54 ක් සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබූ අතර එම තනතුරුවලින් 16 ක් වැඩ බැලීම මගින්ද, 38 ක් වැඩ ආවරණය කිරිම මගින්ද රාජකාරි කටයුතු ඉටුකර ගෙන යනු ලබයි. | පිළිතුරු ලබා දී නොමැත. | කටයුතු කඩිනම් කර පරිපාලන ගැටළු විසඳා ගත යුතු වීම. |